# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ
# ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධිත උපලේඛනය

| ජේද අංකය | දැනට තිබෙන පෙළ | ජේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 4:5:9 | "මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දිනට (2010.10.26) පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ (2001.11.26 දින සිට) I වන පන්තියට පත්වී සිටින සේවකයින් I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ. දැනට සේවයේ සිටින සේවකයන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වීමට මෙම ව්‍යවස්ථා සංග්‍රහය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දිනයේ සිට විභාග අවස්ථා 03 ක සහන කාලයක් දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් නවසේවා ව්‍යවස්ථාවේ ඇතුලත් කර ඇති සුදුසුකම් සපුරා ගතයුතුය. මෙහිලා සුදුසුකම් යනුවෙන් අදහස් කරනුයේ කාර්යක්ෂමතා කඩඉම හා රාජ්‍ය භාෂාව සමත්වීම වේ" | 4:5:9 | (අ) 2008.07.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද 2010.10.26 දිනට පෙර I වන පන්තියට උසස්වී/අන්තර්ග්‍රහණයවී සිටින නිලධරයන් I වන පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.<br><br>(ආ.) 2001.11.26 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව II වන පන්තියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන්ට 2011.11.26 දින දක්වා 2001.11.26 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව උසස්වීම් ලබාගත හැකිය. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 9/2013 හි 06 වෙනත් යටතේ අ වගන්තිය කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින , එදින වන විට II වන ත්තියට උසස්ව සිටින සෑම නිලධරයෙකුටම ව්‍යවස්ථාවේ 17 වගන්තියේ දැක්වෙන පරිදි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 03 ක සහන කාලය හිමිවන බව සඳහන් කර ඇති බැවින් හා ආ වගන්තියෙහි සේවා ව්‍යස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ I වන පන්තියට උසස්වී සිටින නිලධරයන් I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ යන්න ඇතුලත් කර ඇති බැවින් එම වගන්ති |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-15 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 4:5:10 | 2001.11.26 දින සිට ක්‍රියාත්මක වූ පැරණි ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි එක් අවස්ථාවකදී කාරයක්ෂමතා කඩඉම සමත් සේවකයින් සඳහා උසස්වීම් ලබාගැනීමේ හිමිකම තිබූ බැවින් හා 2001.11.26 දිනට 11 වන පන්තියට හා 1 වන පන්තියට අන්තර්ග්‍රහණය තුළින් උසස්වීම් ලද සේවකයින්ට එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සමත්ව ඇත්නම් නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇත්තේ එක් අවස්ථාවකදී පමණක් වන බැවින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය එක් අවස්ථාවකදී සමත් සේවකයින් සඳහා 2011.11.26 දින දක්වා පැරණි ව්‍යවස්ථාවේ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා පමණක් 2011.11.26 දින දක්වා උසස්වීම් ලබාගැනීමට හිමිකම් ඇත. 2011.11.26 දිනෙන් පසුව නව ව්‍යවස්ථාවේ 4:5:9 විධිවිධාන අදාළ කර ගත යුතුය. | 4:5:10 | 4:5:9 වගන්තිය යටතට නොගැනෙන I සහ II ශ්‍රේණිවල සියළුම නිලධරයන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා 2014.04.04 දින සිට වාරික පරීක්ෂණ 03 ක සහන කාලයක් හිමිවේ. | ඇතුළත් කර මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 4:5:9 හා 4:5:10 වගන්ති දෙක සංශෝධනය කිරීම සඳහා |

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිනි දසනායක මහතා (සභාපති) ..........
02. යූ.ජී. බෝගහපිටිය මහතා (සාමාජික) ..........
03. පී.පී.එස්.ජී. දිසානායක මිය (සාමාජික) ..........
04. වෛත්‍යලිංගම් නන්දකුමාර් මහතා (සාමාජික) ..........
05. ඒ.ජේ.එම්.මොහිදීන් නිස්තාර් මහතා (සාමාජික) ..........

දිනය:- 2017.03.14

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-15 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්